**ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධින ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත

මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩාගාර පොත් අනුව නොපියවන ලද අග්‍රිම ශේෂය රු.310,093 ක් වුවද එම වටිනාකම මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය තුළ ජංගම වගකීම් හා මූල්‍ය වත්කම් තුළ නිසි පරිදි දක්වා නොතිබුණි. | වර්ෂය අවසාන ශේෂයන් නිසි පරිදි ගිණුම්ගත කිරිමට කටයුතු කිරිමේ අවශ්‍යතාවය. | 2019 ජනාධිපතිවරණ රාජකාරී සඳහා සහභාගී වූ නිලධාරීන් වෙනුවෙන් කළ ගෙවීම වන අතර මේ වන විට මැතිවරණ කාර්යාලය මගින් නිරවුල් කර ඇති බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) **ආදායම් සංකේතාංකය සහ ආදායම් සංකේතාංක විස්තරය- 10.02.10.00 - සමාජ වගකීම් බද්ද** | | |
| 2019 දෙසැම්බර් 31 දින වන විට උක්ත ආදායම් ගිණුමට අදාලව රු.64,630,999 ක මුදලක් හිඟව පැවති අතර මෙම ශේෂය තුල වසර 06 ඉක්මවූ රු.63,012,706 ක ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි 128 (ඉ) ප්‍රකාරව රාජ්‍ය ආදායම එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන් දීමේ නිලධාරීන් සහ | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි 128 (ඉ) ප්‍රකාරව රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදවීමේ අවශ්‍යතාවය. | සමාජ වගකීම් බද්ද එක් රැස් කරන ආයතන වන ශ්‍රී ලංකා රේගුව හා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වගකීමට බැඳෙන බවත් ගණන්දීමේ නිලධාරියා ලෙස මෙම දෙපාර්තමේන්තුව අර්ධ වාර්ෂිකව හිඟ ආදායම් වාර්තා ලබා ගෙන ඇති බවත්, එසේම එය කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර සඳහා උපදෙස් ලබා දී ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු විමසා රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදවන බවට රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරියෙකු විසින් වගකීමට බැඳේ. | | |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඇස්තමේන්තු කිරීමේදී, විධිමත්ව සමාලෝචනය කිරීම හා විශ්ලේෂණ කිරීම මත ආදායම් ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව හා වර්ෂය තුළ රැස්කළ තත්‍ය ආදායම් අතර සියයට 22 සිට 79 ක් දක්වා වාසිදායක විචලනයන් හා සියයට 30 සිට 325 දක්වා අවාසිදායක විචලනයන් නිරීක්ෂණය විය. | එක් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට විශේෂයෙන් පැවරිය නොහැකි ආදායම් සම්බන්ධයෙන් සෘජු අධීක්ෂණයක් දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතුවීමේ අවශ්‍යතාවය. | 2019 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට පාදක කරගත් මූලික උපකල්පන හා ඒවායෙහි තත්‍ය හැසිරීමත්, රජයේ ප්‍රතිපත්තිමය තීරණ මෙන්ම පාලනයෙන් තොර විදේශ වෙළෙඳපොළ මෙන්ම දේශීය වෙළෙඳපොළ හැසිරීමත්, පොළී අනුපාතයන්ගේ හා විනිමය අනුපාතයන්හී ඇතිවූ වෙනස්වීම් කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම මෙන්ම හදිසි ආපදා තත්ත්වයන් ඇතිවීම ආදිය මගින් රාජ්‍ය ආදායම මත ඇතිකළ පීඩනය අපේක්ෂිත මට්ටමින් විචලනය වීමට මූලික වශයෙන් බලපානු ලබන ප්‍රධාන හේතූන් වේ. |
| (ඇ) | බදු ආදායම් යටතේ වූ මත්පැන් බදු ආදායමෙහි 1994 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.986,683,292 ක හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් හෝ දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන තිබූ බව විගණනයේදී නිරීක්ෂණය නොවීය. | හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මෙම හිඟ බදු මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කරමින් පවතින බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නියැදි පරීක්ෂාවේදී දෙපාර්තමේන්තු 12 කට අදාළව 2017 දෙසැම්බර් 31 දිනට රු.3,682,886,537 ක සමුච්චිත හිඟ මුදලක්ද 2018 වර්ෂය සඳහා රු.815,593,770 ක හිඟ මුදලක්ද 2019 වර්ෂය සඳහා රු.938,291,784 ක හිඟ මුදලක්ද වශයෙන් එකතුව රු.5,436,772,091 ක් වූ හිඟ මුදල් පැවති බව නිරීක්ෂණය විය. | -එම- | රජයේ බදු හා බදු නොවන ආදායම් සඳහා මෙතෙක් ඇති සියළුම ආදායම් සංකේතාංකයන් හා සබැඳි හිඟ ආදායම් සම්බන්ධයෙන් මේ වනවිට දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම උදෙසා විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරමින් සිටින බවත්, පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන්ද මෙහිදී විශේෂ අවධානයක් යොමුකිරීමට කටයුතු කරන බවත් දන්වා එවා තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ගුවන් හමුදා දෙපාර්තමේන්තුව විසින් අංක 20.03.06.00 දරන ආදායම් සංකේතාංකය යටතේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුමේ රාජකාරී තුළින් ලද ආදායමේ 2017 දෙසැම්බර් 31 දින දක්වා ඇමෙරිකානු ඩොලර් 1,544,118 ක සමුච්චිත හිඟ මුදලක්ද 2018 වර්ෂයට අදාලව ඇමෙරිකානු ඩොලර් 3,228,591 ක හිඟ මුදලක්ද 2019 වර්ෂයට අදාලව ඇමෙරිකානු ඩොලර් 7,271,434 ක හිඟ මුදලක්ද වශයෙන් එකතුව ඇමෙරිකානු ඩොලර් 12,044,143 ක් වූ හිඟ මුදල් පැවති බව නිරීක්ෂණය විය. | -එම- | රජයේ බදු හා බදු නොවන ආදායම් සඳහා මෙතෙක් ඇති සියළුම ආදායම් සංකේතාංකයන් හා සබැඳි හිඟ ආදායම් සම්බන්ධයෙන් මේ වනවිට දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම උදෙසා විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරමින් සිටින අතර, ඔබ විසින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන්ද මෙහිදී විශේෂ අවධානයක් යොමුකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඊ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව එහි II උපලේඛනයෙහි (1) (අ) යටතේ දක්වා ඇති ආදායම් ගණන් දීමේ නිලධාරීන් | දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු වාර්තා අදාල චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 අනුව ආදායම් ගණන් දීමේ නිළධාරින් විසින් තම ආදායම් කාර්යසාධන වාර්තා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත |

| | | |
|---|---|---|
| විසින් තම මාසික වාර්තා එළඹෙන මාසයේ 10 වැනි දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කළ යුතු වුවත් සුරාබදු දෙපාර්තමේන්තුව එපරිදි කටයුතු කර නොතිබුණු අවස්ථා විය. | | යොමුකල යුතු ආකාරය පිළිබඳව පැහැදිලිව දක්වා ඇති බැවින් ආදායම් ගණන් දීමේ නිළධාරින් නිවැරදි අයුරින් අදාළ තොරතුරු හා වාර්තා නියමිත පරිදි ලබාදීමට නිරන්තරයෙන් බැඳී සිටි. මේ සම්බන්ධයෙන් සෘජුවම අදාළ ආදායම් ගණන් දීමේ නිළධාරින් විසින් වගකිවයුතු බවත් මෙම දෙපාර්තමේන්තුව සියළුම ආදායම් ශිර්ෂයන්ගේ මාසික ආදායම් කාර්යසාධනය පිළිබද දත්ත භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් පාදක කරගනිමින් ඒවා ඇගයීමකට භාජනය කරනු ලබන අතර එම තොරතුරු අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා භාවිතා කරනු ලැබේ. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් තුල 2006/2007 වර්ෂවල සිංගප්පූරුවේ පැවැත්වූ ජාත්‍යන්තර බේරුම්කරණයේ දී පෞද්ගලික සමාගමක ගැටළු නිරාකරණය කිරීමට අදාළව ගෙවිය යුතු මුදල ලෙස රු.1,670,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර වර්ෂය අවසානයේදී එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාවය. | මේ සඳහා ජාත්‍යන්තර බේරුම්කරණ ප්‍රධානය අනුව අදාල සමාගම සමඟ ගිවිසුමක් අත්සන් කළ යුතුව ඇති බවත් ඒ දක්වා ගිවිසුම්ගත නොවූ හෙයින් එම මුදල් ගෙවීම සඳහා ඉදිරිපත් වී නොමැති හෙයින් ගෙවීම සඳහා ඉදිරිපත් වන තෙක් ඒ සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කර ගත යුතුව ඇති බව දන්වා එවා තිබුණි. |

**3.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 07 ක් පුරප්පාඩුව පවතින අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 13 කි. මෙම පුරප්පාඩු තුල ජොෂ්ය මට්ටමේ තනතුරු 04 ක් පවතින අතර මෙම තනතුරු අඛණ්ඩව පුරප්පාඩු වී පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි කරුණක් බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | සමස්ත කාර්ය මණ්ඩල පිළිබඳව මේ වන විට ඇගයීමක් සිදුකරමින් පවතින බැවින් ඒ අනුව ඉදිරි කාර්යමණ්ඩල අවශ්‍යතාවය මත අදාළ බඳවා ගැනීම් සිදුකරන බව දන්වා එවා තිබුණි. |